**ගම්පොල නගර සභාව**

**මහනුවර දිස්ත්‍රික්කය**

**----------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.**

**----------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන, 2016 මාර්තු 03 දින ද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 30 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජුනි 20 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය.**

**---------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ගම්පොල නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**--------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

**------------------------**

2004 වර්ෂයට අදාළව පැවති රු.106,268ක හිඟ පොදු වැසිකිළි ගාස්තුවක් අයකරගැනීමට පවරන ලද නඩුවකින් විත්තිකරු නිදහස්වී ඇතත්, එම මුදල තවදුරටත් ණයගැතියෙක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

**1.3.2 නොසැසඳූ පාලන ගිණුම්**

**------------------------------**

සේවක ණය ගිණුමේ ශේෂය රු.17,123,189ක් වූ අතර සේවක ණය ලේඛනය අනුව එය රු.14,548,103ක් වූයෙන් රු.2,575,086ක නොසැසඳීමක් විය.

**1.3.3 ලැබියයුතු ගිණුම්**

**-------------------**

2015 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම 13,807,044 ක් වූ අතර එයින් අවුරුදු 01ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂවල වටිනාකම රු.10,737,280ක් වී තිබුණි.

**1.3.4 ගෙවිය යුතු ගිණුම්**

**---------------------**

2015 දෙසැම්බර් 31 දිනට ගෙවියයුතු ගිණුම් ශේෂ 04ක වටිනාකම රු.12,296,424ක් වූ අතර, එයින් අවුරුදු 01ක කාලයක් ඉක්මවා තිබූ ශේෂවල වටිනාකම රු.11,117,729ක් වි තිබුණි.

**1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම**

-----------------------------------

වසර 05කට අධික කාලයක සිට ලැබියයුතු ගිණුම් ලෙසට මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ලංකා විදුලි බල මණ්ඩලයෙන් ලැබිය යුතු රු.44,682,119ක ශේෂය සභාව වෙත සත්‍ය වශයෙන්ම ලැබෙන බවට කිසිදු තහවුරුවක් විගණනයට නොලැබුණි.

**1.3.6 නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම**

-------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය කරනු ලැබේ.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>571 | අවස්ථා 163කදී තැන්පත් කර වසර 02ක් ඉක්මවූ රු.1,781,000ක් වටිනා තැන්පතු නියාදනය කර නොතිබුණි. |
| (ආ) | පළාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන චක්‍රලේඛය | සභාව සතු කඩ කාමර සඳහා වසර 05කට වරක් කුලී තක්සේරු කර නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහය<br>xxiv පරිච්ඡේදයේ 4වන වගන්තිය | විශ්‍රාමගිය/මියගිය හෝ සේවය අවසන් කළ නිලධාරීන් 04 දෙනෙකුගෙන් අයකරගත යුතු රු.109,594ක සේවක ණය අයකර ගෙන නොතිබුණි. |
| (ඈ) | 2009 ජූනි 17 දිනැති අංක 9/2009 (1) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | 2015 පෙබරවාරි 13 දින සභාවේ සේවයට වාර්තා කර ඇති වර්තමාන ලේකම්වරයා සභාවේ ඇති ඇඟිළි සළකුණු යන්ත්‍රය මඟින් 2015 දෙසැම්බර් අවසානය දක්වා පැමිණීම හා පිටවීම සනාථ කර නොතිබුණි. |

**2. මූල්‍ය සමාලෝචනය**

----------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2015දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.50,951,836ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.34,563,421ක් වුයෙන්, මූල්‍ය ප්‍රතිඵලයේ රු.16,388,415 ක වර්ධනයක් දක්නට ලැබුණි.

## 2.2 විග්‍රාහාත්මක මූල්‍ය සමාලෝචනය

(අ) මූල්‍ය ප්‍රතිඵලයේ රු.16,388,415 ක වර්ධනයට ආදායම් විෂයන් 05ක සියයට 4.8 සිට සියයට 200 දක්වා වැඩිවීම හා හා වියදම් විෂයයන් 04ක සියයට 8 සිට සියයට 80 දක්වා අඩුවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ වැටුප් ප්‍රතිපූර්ණ වශයෙන් රු.78,879,358ක් ලැබී තිබුණ නමුත්, වැටුප් හා දීමනා ලෙස රු.98,420,731ක් ගෙවා තිබුණි. ඒ අනුව සභාවේ ආදායමෙන් රු.19,541,373ක මුදලක් සභාවේ සේවකයින් සඳහා වැටුප් ගෙවීමට වැයකරන බව නිරීක්ෂණය වූ අතර, එම මුදල් සභාවේ ස්වයං උත්පාදන ආදායමින් සියයට 23ක් ගෙන තිබුණි.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ආදායම් රැස් කිරීමේ කාර්යය සාධනය

ලේකම්වරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2015.01.01 ට හිඟය | වර්ෂයයට අදාළ අදාල කිරිම් | එකතු කළ අදායම් 2015.01.01 දිනට හිඟයෙන් එකතු කළ අදායම් | 2015 වර්ෂයේ බිල් කළ ආදායමෙන් එකතු කළ ආදායම් | මුළු අය කලයුතු ප්‍රමාණය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් බදු | 40,513,360 | 33,400,039 | 9,799,907 | 16,047,600 | 48,065,892 |
| බලපත්‍ර ගාස්තු | - | 618,483 | - | 618,483 | - |
| කුලී (කඩ හා නිවාස) | 8,893,496 | 9,700,177 | 1,664,358 | 6,298,476 | 10,630,839 |
| වෙනත්(සභා ඉඩම් බදු) | 1,361,268 | 555,281 | 950,432 | 234,932 | 731,185 |
| | | | | | 59,427,916 |

සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.59,427,916 ක මුළු ආදයම් ශේෂයක් හිඟ හිට තිබුණි.

### 2.3.2 වරිපනම් බදු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය ආරම්භයේදී රු.40,513,360ක හිඟයක් පැවති අතර වර්ෂය තුළ අයකර ගැනීම 24%ක් විය. වර්ෂයේ බිල්කිරීම්වලින් අයවීම 48%ක් වූ අතර දෙසැම්බර් 31 දිනට මුළු වරිපනම් බදු හිඟය රුපියල් මිලියන 48ක් විය.

(ආ) සභාවේ ආදායම් පරීක්ෂක නිලධාරීන් 4 දෙනෙකු, දේපළ තහනම් කිරීමේ නිලධාරීන් තිදෙනෙක් හා කොමිස් පදනමට අදායම් අයකරන සේවකයෙකු සේවයේ යොදවා ඇතත් වර්ෂය අවසානයට මිලියන 48ක හිඟයක් පැවැතුණි.

(ඇ) මිලියන 48 ක වරිපනම් බදු හිඟයක් වර්ෂ ගණනාවක සිට ඉදිරියට ගෙන එමින් පැවතියද නගර සභා ආඥා පනතේ 170 වගන්තිය ප්‍රකාරව කිසිදු දේපළක් තහනමට ගෙන නොතිබුණි.

(ඇ) වර්ෂ 05කට වරක් දේපළ තක්සේරු කළ යුතු වුවත් 2008 වර්ෂයේ තක්සේරුව මත 2015 වර්ෂයේදීද වරිපනම් බදු අයකර තිබුණි. 2008 සිට මේ වන විට බලප්‍රදේශය විශාල වශයෙන් දියුණුවී තිබුණද, දේපළ තක්සේරු කර වරිපනම් බදු අළුත් නොකිරීම නිසා සභාවට විශාල ආදායමක් අහිමිවී තිබුණි.

### 2.3.3 බදු කුලී

--------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාව සතු ඉඩමක ඉදිකරන ලද නීතීඥ සංකීර්ණයක් වසර 10කට බදුදී තිබූ අතර ඒ සඳහා ප්‍රධාන අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. එම සංකීර්ණයෙන් 2015 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු කුලී රු.43,000ක් විය. මෙම කාමර කුලී ගෙවීම ප්‍රමාද කිරීම හෝ නොගෙවා සිටින අවස්ථාවලදී ඒ සම්බන්ධව කටයුතු කළ යුතු ආකාරය ගිවිසුම්වල සඳහන් කර නොතිබුණි.

(ආ) පොදු වෙළඳ පොළ ගව මස් කඩ දෙකක් හා කහටපිටිය ගව මස් කඩය බදුදීමේ ගිවිසුම පරිදි මාසිකව බදු මුදල් ගෙවීම ප්‍රමාද වුවහොත් 1%ක දඩ මුදලක් අයකළ යුතු වුවද, 2015 දෙසැම්බර් 31 දිනට පැවැති හිඟ මුදල් වෙනුවෙන් දඩ මුදල් අයකර නොතිබුණි.

(ඇ) පොදු වෙළඳපොළ එළු මස් කඩ දෙකක් ටෙන්ඩර් මඟින් බදුදී තිබූ අතර දෙසැම්බර් 31 දිනට රු.451,573ක හිඟයක් පැවැතුණි. මේ සම්බන්ධව ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඈ) පොදු වෙළඳ පොළ කුකුල් මස් කඩ දෙකක් ටෙන්ඩර් මඟින් බදුදී තිබූ අතර බදුකරුවන් සමඟ ගිවිසුමකට එළඹ නොතිබුණි. දෙසැම්බර් 31 දිනට රු.1,085,102ක හිඟ මුදල් පැවැතුණි.

### 2.3.4 ඉඩම් බදු

-----------

වසර 10කටත් වැඩි කාලයක සිට ඉඩම් තක්සේරු කර නොතිබීම නිසා බොහෝ ඉඩම්වලින් ඉතා සුළු බදු මුදලක් අයකරමින් පැවතුණි.

### 2.3.5 ව්‍යාපාර බදු

--------------

නගර සභා බලප්‍රදේශය තුළ පවත්නා ව්‍යාපාර ආයතනවලින් වර්ෂයට අදාළ ව්‍යාපාර බදු රු.174,164ක් 2016 මාර්තු 25 දින වන විටත් අයකරගෙන නොතිබුණි.

### 2.3.6 ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු

--------------------------------

ප්‍රචාරක දැන්වීම් පුවරු පිළිබඳව විධිමත් සමීක්ෂණයක් සිදුකර නොතිබුණු අතර ඒ සම්බන්ධව ලේඛනයක් පවත්වා නොතිබුණි.

### 2.3.7 පරිසර ආරක්ෂණ බලපත්‍ර

---------------------------

1988 අංක 56 හා 2000 අංක 53 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පරිසර පනත සහ ඒ යටතේ පනවන ලද රෙගුලාසිවලට අනුකූලව 2008 ජනවාරි 25 දිනැති

අංක 1533/16 දරන පාරිසරික හා ස්වභාවික සම්පත් අමාත්‍යවරයා විසින් නිකුත් කරන ලද අතිවිශේෂ ගැසට් නිවේදය අනුව නිකුත් කරන පරිසර බලපත්‍ර වසර 03කට පසු නැවත අළුත් කළ යුතු වුවද, පසු විපරම් කටයුතු සිදුකර ව්‍යාපාර 30ක් සඳහා බලපත්‍ර නිකුත් නොකිරීම නිසා රු.134,400ක ආදායමක් සභාවට අහිමිවී තිබුණි.

**2.3.8 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

-------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2015 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ රු.608,580ක් හා මුද්දර ගාස්තු රු.20,000,000ක් ලැබිය යුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

-------------------------------------

සභාවේ අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා 35 දෙනෙකු සේවයේ ස්ථිර කර තිබියදී අනියම් සේවකයින් 12 දෙනෙකු ද සේවයේ යොදවා 2015 ජනවාරි සිට දෙසැම්බර් දක්වා වැටුප් වශයෙන් රු.3,937,484ක මුදලක් ගෙවා තිබුණි.

**3.2 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

-----------------------------------

සභා බල ප්‍රදේශයේ දෛනිකව ටොන් 20කට ආසන්න කසළ ප්‍රමාණයක් එකතුවන අතර එම කසළ කළමනාකරණය සඳහා විධිමත් වැඩ පිළිවෙලක් සකසා නොතිබුණි. එකතුවන කසළ අම්බුළුවාව ජෛව විවිධත්ව සංකීර්ණයට බැහැර කිරීම හා වරින්වර පස්දමා වැසීම සිදු කර තිබුණි. මේ සම්බන්ධව මාවනැල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවක්ද විභාගවෙමින් පවතින අතර වරින්වර මහජන විරෝධතාද එල්ල වෙමින් පවතින බව නිරීක්ෂණය විය.

**4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය.**

----------------------------------------

**4.1 ප්‍රසම්පාදන සැලැස්ම**

---------------------

සමාලෝචිත වර්ෂය සඳහා සභාව ප්‍රසම්පාදන සැළැස්මක් සකස් කර නොතිබුණි.

**4.2 අයවැය පාලනය**

-------------------

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛණයට අනුව ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තත්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී ආදායම් විෂයයන් 04ක සියයට 21 සිට සියයට 276 දක්වාද වියදම් විෂයයන් 07ක සියයට 46 සිට සියයට 82 දක්වාද විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛණය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණි. 2014 වර්ෂය වෙනුවෙන් සකස්කරන ලද අයවැය ලේඛනය හා වැය ලේඛන පරීක්ෂාවේදී බොහෝමයක් වියදම් ශීර්ෂවල අධිප්‍රතිපාදන වෙන්කර තිබුණි. මේ නිසා වර්ෂයේ වියදම්, ඇස්තමේන්තු මුදලින් සියයට 50කට වඩා අඩුවී තිබුණි.

**4.3 අභ්‍යන්තර විගණනය**

-----------------------

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 133 සහ 2009 ජූනි 09 දිනැති අංක ඩීඑම්ඒ/2009/01 දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

**4.4 වත්කම් කළමනාකරණය**

**------------------------------**

**නිෂ්ක්‍රිය /ඌන උපයෝජිත වත්කම්**

**---------------------------------------**

සමාලෝචිත වර්ෂය අවසානයට රු.630,220 ක වටිනාකමක් වූ වත්කම් විෂයයන් 03ක් අවුරුදු 3-6 අතර කාල සීමාවක සිට නිෂ්ක්‍රියව හා ඌන උපයෝජිතව පැවතුණි.

**5. පද්ධති හා පාලනය**

**--------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වතකම් කළමනාකරණය